# නර්තන තරග සඳහා අදාළ කොන්දේසි

**(පොදු උපදෙස් හා කොන්දේසිවලට අමතරව බලපැවැත්වේ.)**

1) කලායතනයකට සහභාගී විය හැකි උපරිම තරග ශීර්ෂ සංඛ්‍යාව හතරකි.

2) බෙර වාදන තරගය දිරිගැන්වීමේ තරග ශීර්ෂයක් සේ සැලකෙන අතර කලායතනයකට බෙර වාදන ශීර්ෂ යටතේ සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව දෙකකි.

3) දිස්ත්‍රික් තරග සඳහා පුහුණු ඇඳුමෙන් තරගයට ඉදිරිපත්වීම ප්‍රමාණවත් වේ.

4) සියළුම නර්තන තරගයන්හි සහය ගායකයන්ට හා සහය වාදකයන්ට වයස් සීමාවක් බල නොපාන අතර විනිශ්චය මණ්ඩලයට දර්ශනය වන පරිදි ඉදිරිපත් කිරීම කළ යුතුය.

5) දිස්ත්‍රික් මට්ටමින් තරගයට ඉදිරිපත් වන තරගකරුවන් හෝ අතිරේක තරගකරුවන් හැර වෙනත් තරගකරුවෙකුට පළාත් අවසාන තරගාවලියට සහභාගීවිය නොහැකිය.

6) ඒක් එක් තරගවලදී පහත සඳහන් නිර්ණායක ඔස්සේ ලකුණු ලබාදීම සිදු කරනු ලැබේ.

- සාම්ප්‍රදායික බව සහ නිවැරදි අංගහාර භාවිතය
- රංග වින්‍යාසයන්හි නිර්මාණාත්මක බව
- විධිමත් ගායනය, වාදන හා තාලරූප,
- අවකාශ භාවිතය හා ප්‍රාසංගික ඉදිරිපත් කිරීම

**සැ.යු. රංග වස්ත්‍රාභරණ සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.**

7) නර්තන තරග සඳහා එක් එක් දිස්ත්‍රික්කයෙන් ප්‍රථම හා දෙවන ස්ථානය ලබා ගන්නා නර්තනාංග පළාත් අවසාන තරගය සඳහා සුදුසුකම් ලබන අතර, එසේ ප්‍රථම හා දෙවන ස්ථාන ලබාගන්නා නර්තනාංග පළාත් තරගය සඳහා සුදුසු මට්ටමක නොපවතින්නේ නම් එම නර්තන අංගය පළාත් තරගයට නිර්දේශ නොකිරීමට විනිශ්චය මණ්ඩලයට බලය පැවරෙනු ඇත.

8) ඉන්දියානු නර්තන සඳහා අවශ්‍ය විද්‍යුත් උපකරණ ඔබ විසින් රැගෙන ආ යුතුය. අවශ්‍යතාවය පරිදි පටිගත කළ සංගීත ඛණ්ඩ භාවිත කළ හැකිය.

9) කාලය පිළිබඳ සැලකිලිමත් විය යුතුය. එහෙත් ප්‍රශස්තම තරග අංගයක් ඉදිරිපත් කිරීමේදී එහි කාල කළමනාකරණයෙහි සුළු වෙනසක් වුවද එය සලකා බැලීමේ අයිතිය විනිශ්චය මණ්ඩලය සතුය. නියමිත කාලය ඉක්මවා යන්නේ නම්, එය තරග නීති උල්ලංඝනය කිරීමක් ලෙස සලකා තරගයෙන් ඉවත් කිරීමේ අයිතිය විනිශ්චය මණ්ඩලය සතුය.

## තරග ශීර්ෂ

### 01. උඩරට ශාස්ත්‍රීය : වයස අවුරුදු 12-21

i. පිරිමි සමූහ - යක්ඇනුම
ii. ගැහැණු සමූහ - ආවැන්දුම

| | |
|---|---|
| නර්තනය සඳහා | - අවමය 06 කි. උපරිමය 12 කි. |
| සහාය ගායන/වාදන සඳහා | - උපරිමය 06 කි. |
| කාලය | - අවම විනාඩි 05, උපරිම විනාඩි 06 කි. |

### 02. පහතරට ශාස්ත්‍රීය : වයස අවුරුදු 12 – 21

i. පිරිමි සමූහ - තෙල්මෙ
ii. ගැහැණු සමූහ - මල්යහන් කවි ගයමින් නැටීම

| | |
|---|---|
| නර්තනය සඳහා | - අවමය 06 කි. උපරිමය 12 කි. |
| සහාය ගායන/වාදන සඳහා | - උපරිමය 06 කි. |
| කාලය | - අවම විනාඩි 05, උපරිම විනාඩි 06 කි. |

### 03. සබරගමු ශාස්ත්‍රීය : වයස අවුරුදු 12 – 21

i. පිරිමි සමූහ - මුදුන් තාලය
ii. ගැහැණු සමූහ - සළඹ ශාන්තිය හා සළඹ පද

| | |
|---|---|
| නර්තනය සඳහා | - අවමය 06 කි. උපරිමය 12 කි. |
| සහාය ගායන/වාදන සඳහා | - උපරිමය 06 කි. |
| කාලය | - අවම විනාඩි 05, උපරිම විනාඩි 06 කි. |

### 04. නව වන්නම් නිර්මාණය : වයස අවුරුදු 12 – 21

- මිශ්‍ර තරගයකි
- දැනට භාවිතයෙහි පවතින වන්නමක් ඇසුරින් නොවිය යුතුය.
- උඩරට සම්ප්‍රදායේ වන්නම් ආකෘතියට අනුව නිර්මාණය කර තිබිය යුතුය. (බෙර පදය,තානම,කවිය,කස්තිරම,සීරුමාරුව,අඩව්ව)

| | |
|---|---|
| නර්තනය සඳහා | - අවමය 06කි.උපරිමය 12කි. |
| සහාය ගායන/වාදන සඳහා | - උපරිම 10කි |
| කාලය | - අවම විනාඩි 05 කි. උපරිම විනාඩි 06 කි. |

## 05. ජන නැටුම් : වයස අවුරුදු 12න් පහළ

i.පිරිමි සමූහ - කඩු හරඹ
ii.ගැහැණු සමූහ - සවරන්
iii.මිශ්‍ර - තාලම්

නර්තනය සඳහා - අවමය 06කි.උපරිමය 12කි.
සහාය ගායන/වාදන සඳහා - උපරිම 10කි
කාලය - අවම විනාඩි 05 කි. උපරිම විනාඩි 06 කි.

## 06 ඉන්දියානු නැටුම් හරත - වයස අවුරුදු 12 -21

i.ගැහැනු සමූහ - අලාරිප්පු
ii.මිශ්‍ර සමූහ - තීර්තනම්

නර්තනය සඳහා - අවමය 06 කි. උපරිමය 12 කි.
කාලය - අවම විනාඩි 05කි. උපරිමය විනාඩි 06 කි.

## 07 ඉන්දියානු නැටුම් කථක් - වයස අවුරුදු 15 -21

i.ගැහැනු සමූහ - ධුමරි
ii.මිශ්‍ර සමූහ - තරාණා

නර්තනය සඳහා - අවමය 06 කි. උපරිමය 12 කි.
කාලය - අවම විනාඩි 05 කි. උපරිමය විනාඩි 06 කි.

## 08 සමූහ වාදනය - (මිශ්‍ර) අවුරුදු 12– 21

වාදක කණ්ඩායම - අවමය 08 කි. උපරිමය 20 කි.
කාලය - අවමය විනාඩි 05, උපරිමය විනාඩි 08 කි.

දේශීය තූර්ය භාණ්ඩ හා ආදේශ භාණ්ඩ යොදාගත යුතුය.

උඩරට, පහතරට, සබරගමු ශාන්තිකර්මයන්හි වාදන ආශ්‍රයෙන් කළ නිර්මාණයක් විය යුතුය. එසේ වුවත් එම බෙර පද ඇසුරෙන් සිදු කළ නිර්මාණාත්මක බෙර පද උචිත පරිදි භාවිත කළ හැකිය.

## බෙර වාදන තරග සඳහා අදාල කොන්දේසි

- ඒකල බෙර වාදනය සඳහා ගැහැණු පිරිමි වශයෙන් වෙන් වෙන්ව ඉදිරිපත් විය යුතුය.
- තරග ශීර්ෂ, වයස් සීමාව හා කාලය පහත පරිදිවේ.

| අනු අංකය | තරග ශීර්ෂ | සම්ප්‍රදාය | වයස් සීමාව අවුරුදු | කාලය විනාඩි අවම / උපරිමය |
|---|---|---|---|---|
| 01 | ඒකල බෙර වාදන (ගැහැණු) | උඩරට/පහතරට/සබරගමු | 15 -18 අතර | විනාඩි 03 / විනාඩි 05 |
| 02 | ඒකල බෙර වාදන (පිරිමි) | උඩරට/පහතරට/සබරගමු | 15 -18 අතර | විනාඩි 03 / විනාඩි 05 |
| 03 | යුගල බෙර වාදන | උඩරට/පහතරට/සබරගමු | 15 – 21 අතර | විනාඩි 06 / විනාඩි 08 |

**තරග ශීර්ෂ**

**01.** **ඒකල බෙර වාදනය**

- උඩරට - මගුල් බෙර වාදනය
- පහතරට - මගුල් බෙර වාදනය
- සබරගමු - මංගල දවුල් වාදනය

**02.** **යුගල බෙර වාදනය**

- උඩරට - අත්‍යා බෙර පද සහ නිර්මාණාත්මක බෙර පද
- පහතරට - පහතරට බෙර පෝය හේවිසි ආශ්‍රිත පද වාදනය
- සබරගමු - අත්‍යා දවුල් පද සහ නිර්මාණාත්මක දවුල් පද

**සිරිසෝම ලොකුවිතාන**
**ලේකම්**
**සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය**
**බස්නාහිර පළාත**